**ජාතික ඖෂධ නියාමන අධිකාරිය - 2017**

-----------------------------------------

ජාතික ඖෂධ නියාමන අධිකාරියේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයේ මෙහෙයුම් කටයුතු පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 2015 අංක 05 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනතේ 20 වන වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 13(6) වගන්තිය ප්‍රකාර ඉදිරිපත් කළයුතු 2017 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන මෙම වාර්තාවේ දින වනවිටත් ඉදිරිපත් කර නොතිබුණි. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළයුතු යැයි අදහස් කරන සමාලෝචිත වර්ෂයේ අධිකාරියේ ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් වූ මාගේ නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

-----------------------------------------------------------------

අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

-----------------

**2.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

----------------------------------

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය හා 2004 පෙබරවාරි 24 දිනැති අංක 01/2004 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව, ව්‍යවස්ථාපිත මණ්ඩලවල වාර්ෂික මූල්‍ය ප්‍රකාශන ගිණුම් වර්ෂය අවසන්වී දින 60ක් ඇතුළත විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, 2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මෙම වාර්තාවේ දිනය වන විටත් විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

**2.2 වත්කම් හා වගකීම්වල පැවැත්ම**

-------------------------------------

අධිකාරිය විසින් අවසන්වරට පිළියෙල කරන ලද 2016 දෙසැම්බර් 31 දිනට වූ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වත්කම්, බැරකම්, හිමිකම්, ආදායම් හා වියදම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| අයිතමය | වටිනාකම |
| --- | --- |
| | රු. |
| ජංගම නොවන වත්කම් | 5,528,972 |
| ජංගම වත්කම් | 100,926,209 |
| මුළු වත්කම් | 106,455,181 |
| ජංගම බැරකම් | 43,102,015 |
| ජංගම නොවන බැරකම් | 5,795,491 |
| මුළු බැරකම් | 48,897,506 |
| ශුද්ධ වත්කම් / හිමිකම් | 57,557,675 |
| | 106,455,181 |
| මුළු ආදායම | 165,246,657 |
| මුළු වියදම | 104,698,94 |
| බදු පෙර අතිරික්තය | 60,547,713 |
| ආදායම් බදු | 2,990,038 |
| බදු පසු අතිරික්තය | 57,557,675 |

### 2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම්

ඖෂධ, වෛද්‍ය උපකරණ සහ සීමාස්ථ නිෂ්පාදන ලියාපදිංචි කිරීම සඳහා සමාලෝචිත වර්ෂය තුළදී ලැබුණු අයදුම්පත් ප්‍රමාණය, ලැබුණු දිනය, ඉන් ලියාපදිංචි කළ ප්‍රමාණය හා ලියාපදිංචි කළ දිනය ආදිය පිළිබඳ තොරතුරු, පරීක්ෂා කිරීම සඳහා ප්‍රමාණවත් කාලයක් සහිතව විගණනයට ඉදිරිපත් නොකිරීම හේතුවෙන් ඖෂධ, වෛද්‍ය උපකරණ සහ සීමාස්ථ නිෂ්පාදන ලියාපදිංචි කිරීමේ කාර්යසාධනය පිළිබඳ අදහසක් ඉදිරිපත් කිරීමට නොහැකි විය.

### 2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීමේ අවස්ථා පහත පරිදි විය.

| නීති රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම් |
| --- | --- |
| (අ) 2015 අංක 05 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනත 105 වගන්තිය | සීමාස්ථ නිෂ්පාදන සම්බන්ධයෙන් අධිකාරිය විසින් සම්පූර්ණ හෝ තාවකාලික ලියාපදිංචියක් ප්‍රදානය කරනු ලැබිය හැකි අතර ලියාපදිංචිය සඳහා වූ කොන්දේසි නියම කරනු ලැබිය යුතු වුවද, විගණිත දිනය වූ 2018 අගෝස්තු 23 දින වන විටත් එම කොන්දේසි නියම කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ආ) | 2005 අංක 06 දරන එකතුකළ අගය මත බදු (සංශෝධන) පනත | යම් බදු අයකළ හැකි කාලසීමාවක් සම්බන්ධයෙන් වූ බද්ද ඒ බදු අයකළ හැකි කාලසීමාව අවසාන වීමෙන් පසුව එළඹෙන මාසයේ විසිවන දිනට පසු දිනයක් නොවන දිනයක දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ගෙවිය යුතු වුවද, අධිකාරිය විසින් 2017 වර්ෂයට අදාළ එකතුකළ අගය මත බදු 2018 සැප්තැම්බර් 21 දින වන විටත් ගෙවා නොතිබුණි. |
| (ඇ) | 2006 අංක 12 දරන මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනත | සෑම වර්ෂයකම එක් එක් කාර්තුව අවසන්වී දින පහළොවක් ඇතුළත මුද්දර ගාස්තු දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ප්‍රේෂණය කළ යුතු වුවත්, අධිකාරිය විසින් 2017 වර්ෂයට අදාළ මුද්දර ගාස්තු 2018 සැප්තැම්බර් 21 දින වන විටත් ගෙවා නොතිබුණි. |
| (ඈ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| | (i) මුදල් රෙගුලාසි 395 (ඇ) | බැංකු ගිණුම්වල එක් එක් මාසය අවසානයේ ඇති ගනුදෙනු තත්ත්වය සම්බන්ධයෙන් ඊළඟ මාසයේ 15 දිනට පෙර බැංකු සැසඳුම් ප්‍රකාශනයක් පිළියෙළ කළ යුතු වුවද, 2017 සැප්තැම්බර් මාසයට අදාළ බැංකු සැසඳුම් ප්‍රකාශනය 2018 අගෝස්තු 23 දින වන විටත් පිළියෙළ කර නොතිබුණි. ඒ අනුව බැංකු සැසඳුම් ප්‍රකාශන පිළියෙළ කිරීමට අදාළව මාස 11 ක කාල ප්‍රමාදයක් පැවතුණි. |
| | (ii) මුදල් රෙගුලාසි 454 | සමාලෝචිත වර්ෂයේදී වාහන දෙකක් සඳහා මිලදී ගෙන තිබුණු ටයර් 08 ක් සඳහා භාණ්ඩ ලැබීම් පත්‍ර නිකුත් කර නොතිබුණු අතර බඩු වට්ටෝරු පොතක ඇතුළත් කරද නොතිබුණි. |
| | (iii)මුදල් රෙගුලාසි 757 – (2) | සමාලෝචිත වර්ෂයට අදාළව අධිකාරියේ බඩු පිළිබඳ වාර්ෂික සමීක්ෂණ වාර්තා 2018 සැප්තැම්බර් 21 දින වන විටත් විගණනයට ඉදිරිපත් නොකෙරුණි. |
| (ඉ) | 2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | සේවා ස්ථානයක සිටින සේවක සංඛ්‍යාව ගැන නොසලකා වේලා සටහන් යන්ත්‍ර භාවිතා කළ යුතු වුවද, 2014 මැයි 31 දිනෙන් පසු ක්‍රියාවිරහිතව පැවති ඇඟිලි සලකුණු යන්ත්‍ර අලුත්වැඩියා කිරීමට 2018 සැප්තැම්බර් 21 දින වන විටත් පියවර ගෙන නොතිබුණි. |
| (ඊ) | 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පරිගණක, උපාංග සහ මෘදුකාංග සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1. කාර්යසාධනය**

**3.1.1 ක්‍රියාකාරීත්වය හා සමාලෝචනය**

සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර තිබුණු නමුත් ප්‍රගති වාර්තා පිළියෙල කර නොතිබුණු බැවින් අධිකාරියේ ප්‍රගතිය පිළිබඳ නිසි සමාලෝචනයක් කළ නොහැකි විය.

## 3.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

-----------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2015 අංක 05 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනතේ අංක 7 පරිච්ඡේදයෙහි 123 දරන වගන්තිය ප්‍රකාරව, අධිකාරිය විසින් ගනු ලැබූ යම් තීරණයකින් අතෘප්තියට පත් යම් තැනැත්තකු විසින් ඉදිරිපත් කරන අභියාචනා සලකා බැලීම සඳහා ස්ථාපිත කළ යුතු අභියාචනා කමිටුව 2018 සැප්තැම්බර් 21 දින වන විටත් ස්ථාපිත කර නොතිබුණි.

(ආ) පනතේ 38 (2) (අ) හා (ආ) වගන්ති ප්‍රකාරව, සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මකව පැවති ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පර්යේෂණාගාරය 2015 ජූලි 01 දින සිට බලපැවැත්වෙන පරිදි අධිකාරිය වෙත පවරා ගත යුතු වුවද, විගණිත දිනය වූ 2018 සැප්තැම්බර් 21 දින වන විටත් එම පර්යේෂණාගාරය අධිකාරිය වෙත පවරා ගෙන නොතිබුණි.

(ඇ) ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ ලිපි (Waiver of registration) නිකුත් කිරීම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) 2015 අංක 05 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනතේ III වන පරිච්ඡේදයේ IV වන කොටසේ අංක 58 හා IV වන පරිච්ඡේදයේ IV වන කොටසේ අංක 82 වගන්ති අනුව කිසිදු තැනැත්තෙකු විසින් යම් ඖෂධයක් හෝ වෛද්‍ය උපකරණයක් අධිකාරියේ ලියාපදිංචි නොකර සහ අධිකාරියෙන් බලපත්‍රයක් ලබා නොගෙන නිෂ්පාදනය කිරීම හෝ ආනයනය කිරීම නොකළ යුතුය. එම පනතේ 59 හා 83 වගන්ති ප්‍රකාරව, ප්‍රත්‍යක්ෂ ආරක්ෂා සහිත සහ නිවැරදි තත්ත්වයේ ඖෂධ හෝ වෛද්‍ය උපකරණ ලබාදෙන බවට සහතික වීම සඳහා ඇති අවශ්‍යතාවය සැලකිල්ලට ගනිමින් ඖෂධ හෝ වෛද්‍ය උපකරණ ඇගැයීමෙන් පසුව ලියාපදිංචි සහතික හා බලපත්‍ර නිකුත් කිරීම අධිකාරිය විසින් සිදු කළ යුතුය. එසේ වුවද ඉහත සඳහන් විධිවිධානයන්ට පටහැනිව රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව, වෛද්‍ය සැපයීම් අංශය හා අනෙකුත් රජයේ හා පෞද්ගලික ආයතන වෙනුවෙන් 2017 වර්ෂය තුළදී ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ ලිපි 655 ක්ද 2018 ජනවාරි සිට 2018 ජූලි 10 දින දක්වා එවැනි ලිපි 256 ක්ද නිකුත්කර තිබුණි. පනත යටතේ ලියාපදිංචි නොකළ, බලය නොලත් ඖෂධ හා වෛද්‍ය උපකරණ ආනයනකරුවන්ට ඒවා ශ්‍රී ලංකා රේගුවෙන් නිදහස් කරගැනීම සඳහා එම ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ ලිපි භාවිතා කර තිබුණි.

(ii) ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ ලිපි නිකුත් කිරීම හේතුවෙන් ගුණත්වය පිළිබඳ තහවුරුවක් නොමැති වෛද්‍ය සැපයීම් රට තුළට ගලා ඒම වැලැක්විය නොහැකි අතර, 2017 ජනවාරි සිට 2017 ජුනි 14 දින දක්වා ගාස්තුවක් අය කිරීමකින් තොරව එම ලිපි නිකුත් කර තිබුණු බැවින් එම කාලය තුළ අධිකාරියේ ලියාපදිංචි හා බලපත්‍ර ගාස්තු ආදායම අඩුවීමට හේතුවී තිබුණි. 2017 ජුනි 14 දින නිකුත්කර තිබුණු අති විශේෂ ගැසට් පත්‍රය මගින් එම ලිපි නිකුත්කිරීමේදී එක්සත් ජනපද ඩොලර් 100 ක ගාස්තුවක් අයකළ යුතු බවට කොන්දේසි පනවා තිබුණු නමුත් අයකරගත් ගාස්තු ප්‍රමාණය පිළිබඳ විස්තර විගණිත දිනය වූ 2018 සැප්තැම්බර් 21 දින වන විටත් විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(iii) 2015 අංක 05 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනතේ VI වන පරිච්ඡේදයේ I වන කොටසේ අංක 109 වන වගන්තිය අනුව ජීවිතයක් බේරාගැනීම සඳහා හෝ බෝවන රෝග හෝ වසංගත රෝගයක් පැතිරීම වැළැක්වීම සඳහා වැනි විශේෂ අවස්ථානුගත කරුණුවලදී හෝ වෙනත් යම් ජාතික අවශ්‍යතාවයක් සඳහා හෝ

ජාතික ආරක්ෂාව සඳහා ඖෂධ, වෛද්‍ය උපකරණ හෝ සීමාස්ථ නිෂ්පාදන නිශ්චිත ප්‍රමාණවලින් ආනයනය කිරීමට සහ සැපයීමට අධිකාරිය විසින් අවසරය ලබාදිය හැකිය. නමුත් ඉහත සඳහන් විශේෂිත අවශ්‍යතා ගණයට නොවැටෙන, අදාළ ඖෂධයේ හෝ වෛද්‍ය උපකරණයේ ලියාපදිංචිය අවලංගුවීම, ලියාපදිංචි සැපයුම්කරුවන් නොසිටීම හා ලියාපදිංචි සැපයුම්කරුවන් මිල ගණන් ඉදිරිපත් නොකිරීම වැනි හේතු මත සමාලෝචිත වර්ෂය තුළදී ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ ලිපි 163 ක් වෛද්‍ය සැපයුම් අංශය හා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව වෙත නිකුත් කර තිබුණි. එවැනි හේතු මත ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ ලිපි නිකුත් කිරීම, සැපයුම්කරුවන්ගේ ඖෂධ, වෛද්‍ය උපකරණ හා සීමාස්ථ නිෂ්පාදන ලියාපදිංචිය ලබාගැනීමට ඇති උනන්දුව හීන කිරීමට හේතු වන බව නිරීක්ෂණය විය.

(iv) සමාලෝචිත වර්ෂය තුළදී ඖෂධ අයිතම 03 ක් සඳහා නැවත නැවතත් ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ ලිපි නිකුත් කර තිබුණු අවස්ථා 06 ක්ද 2018 ජූලි 10 දක්වා කාලය තුළදී එවැනි අවස්ථා 06 ක්ද පැවතුණි.

(ඇ) රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව විසින් Efavirenz tablets 600 mg ඖෂධයෙන් පිරිවැය රු.483, 371 ක්වූ ඒකක 25,200 ක් හා පිරිවැය රු.249,831 ක් වූ ඒකක 12,600 ක් මිලදී ගැනීමේ කොන්ත්‍රාත්තුව ප්‍රදානය කළ සැපයුම්කරු අධිකාරියේ ලියාපදිංචිය ලබාගෙන නොතිබුණු හෙයින් 2017 ජනවාරි 09 දින හා 2017 සැප්තැම්බර් 18 දින අධිකාරිය විසින් ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ ලිපි 02 ක් නිකුත් කර තිබුණි. නමුත් මෙම ඖෂධය සඳහා 2016 සැප්තැම්බර් 24 දින සිට වර්ෂ 05 ක සම්පූර්ණ ලියාපදිංචිය ලබා සිටි සැපයුම්කරුවෙකු සිටියදී ඒ පිළිබඳව නොසලකා මෙම ඖෂධය සඳහා "ලියාපදිංචි සැපයුම්කරුවන් නොමැත" (There are no registered sources for this product) යන හේතුව සඳහන් කරමින් ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ ලිපි 02 ඉදිරිපත් කර තිබුණි.

**3.3 මෙහෙයුම් ක්‍රියාකාරකම්**

------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ජාතික ඖෂධ නියාමන අධිකාරියේ ඖෂධ සඳහා ලියාපදිංචි සහතික නිකුත් කිරීම සම්බන්ධයෙන් කරන ලද පරීක්ෂාවේදී නිරීක්ෂණය වූ කරුණු පහතින් දැක්වේ.

(i) 2015 අංක 05 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනතෙහි 59 (2) වගන්තිය ප්‍රකාරව, යම් ඖෂධයක් නිෂ්පාදනය කිරීමට හෝ ආනයන කිරීමට අදහස් කරන යම් තැනැත්තෙකු විසින් එම ඖෂධය ලියාපදිංචි කිරීම සඳහා වූ ඉල්ලීම සමග එම ඖෂධයේ සාම්පල් ඉදිරිපත් කරනු ලැබිය යුතු වුවද, සමාලෝචිත වර්ෂය තුළදී නව ඖෂධ ලියාපදිංචිය වෙනුවෙන් ලැබී තිබුණු අයදුම්පත් 599 ක් අතරින් අයදුම්පත් 62 කට අදාළ සාම්පල් ඉදිරිපත් කර නොතිබුණි. නමුත් එම අයදුම්පත් 62 න් අයදුම්පත් 35 කට අදාළව සාම්පල් පරීක්ෂා කිරීමෙන් තොරව ලියාපදිංචි සහතික නිකුත්කර තිබුණි. තවද ඉතිරි අයදුම්පත් 27 ට අදාළ ලියාපදිංචි සහතික නිකුත් කිරීම පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(ii) රසායනාගාර අංශයේ දත්ත ගොනුවේ පරීක්ෂාවට භාජනය කරනු ලබන සාම්පල් වලට අදාල අයදුම්පත් සම්බන්ධ ලිපිගොනු අංකයට යොමුව (Dossier Number) ඇතුළත් කර නොතිබුණු බැවින් සාම්පල් පරීක්ෂා කිරීමේ ප්‍රගතිය පිළිබඳව නිවැරදි විශ්ලේෂණයක් කළ නොහැකි විය. කෙසේ වෙතත් සමාලෝචිත වර්ෂය තුළදී පරීක්ෂා කිරීම සඳහා සාම්පල් 537 ක් ලැබී තිබුණු බැවින් හා සමාලෝචිත වර්ෂය තුළදී රසායනාගාරය විසින් පරීක්ෂා කර තිබුණු සාම්පල් ප්‍රමාණය 85 ක් පමණක් වූ බැවින් සාම්පල් පරීක්ෂා කිරීමේ ප්‍රගතිය සියයට 16 ක් පමණක් වූ බව නිරීක්ෂණය විය.

(iii) 2015 අංක 05 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනතෙහි 59 (4) (ආ) වගන්තිය ප්‍රකාරව, ඖෂධ ලියාපදිංචි කිරීම සඳහා ඉල්ලීමක් ලැබීමේදී අධිකාරිය විසින් එම ඉල්ලීම සමග ඖෂධයේ සාම්පල සහ සියලු විස්තර ඖෂධයේ තත්ත්වය පරීක්ෂා කිරීම සඳහා ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පර්යේෂණාගාරය (එන්එම්කිව්ඒඑල්) වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු වුවද, එම පර්යේෂණාගාරය වෙතින් සාම්පල් පරීක්ෂාව සිදු කර ප්‍රතිඵල නිකුත් කිරීමට ප්‍රථමයෙන්, ඖෂධ සඳහා තාවකාලික ලියාපදිංචි සහතිකයක් ලබා දී තිබුණු අවස්ථා 14ක් නිරීක්ෂණය විය.

(iv) 2015 අංක 05 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනතෙහි 60 (1) (ආ) වගන්තිය ප්‍රකාරව, ඖෂධ ඇගැයීම් කමිටුව (එම්ඊසී) හා ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පර්යේෂණාගාරය (එන්එම්කිව්ඒඑල්) විසින් ඉදිරිපත් කරන ලද වාර්තා සහ අනෙකුත් සියලු වෙනත් කරුණු සැලකිල්ලට ගනිමින් අධිකාරිය විසින් නිශ්චිත කාල සීමාවක් ඇතුළත එම ඖෂධය ලියාපදිංචි කරනු ලැබිය හැකි නමුත් එකම ඖෂධය ලියාපදිංචි කිරීම වෙනුවෙන් ඉදිරිපත් කර තිබුණු අයදුම්පත් සඳහා ලියාපදිංචි සහතික නිකුත් කිරීමට සම්පූර්ණයෙන් එකිනෙකට වෙනස් කාල පරාසයන් ගත කර තිබුණු බව ඖෂධ අයදුම්පත් 47ක් පිළිබඳව පරීක්ෂා කිරීමේදී තහවුරු විය.

(ආ) 2017 ජනවාරි 01 දින සිට 2018 ජූලි 31 දින දක්වා කාලපරිච්ඡේදය තුළදී කොළඹ, තිඹිරිගස්යාය, නුගේගොඩ, රත්මලාන හා දෙහිවල-ගල්කිස්ස යන ප්‍රාදේශීය ලේකම් කාර්යාල 05ට අදාළ බල ප්‍රදේශයන්හි ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීම හා ඔසුසල් බලපත්‍ර නිකුත් කිරීම සම්බන්ධයෙන් සිදුකරන ලද පරීක්ෂාවට අනුව පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීමේ ලේඛණය අනුව එම බලප්‍රදේශ 05 හි එම කාලසීමාව තුළ ඔසුසල් 21ක් ලියාපදිංචි වී තිබුණද ඉන් ඔසුසල් 17 ක් සඳහා විගණිත දිනය වූ 2018 අගෝස්තු 31 දින වන විටත් ජාතික ඖෂධ නියාමන අධිකාරියෙන් ඔසුසල් බලපත්‍රය ලබාගෙන නොතිබුණු බව අධිකාරිය විසින් විගණනයට ලබාදුන් දත්ත ගොනුව පරීක්ෂා කිරීමේදී නිරීක්ෂණය විය. තවද ඔසුසල් බලපත්‍ර නිකුත් කිරීමේදී අදාළ අයදුම්පත්‍රය ලබාගැනීමේ සිට බලපත්‍රය නිකුත් කිරීම දක්වා සියලු තොරතුරු ඇතුළත් කිරීම සඳහා විධිමත් දත්ත ගොනුවක් අධිකාරිය විසින් පවත්වා ගෙන ගොස් නොතිබුණි.

(ii) 2015 අංක 05 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරි පනතේ 119(7) වගන්තිය ප්‍රකාරව, බලපත්‍රයක සඳහන් කළ යුතු නියම හා කොන්දේසි සහ ඔසුසල ලියාපදිංචි කිරීම සඳහා සපුරාලිය යුතු කොන්දේසි පිළිබඳව අමාත්‍යවරයා විසින් නියෝග සකස් කොට ප්‍රකාශයට පත් කිරීම 2018 සැප්තැම්බර් 21 දින වන විටත් සිදු කර නොතිබුණි.

(iii) කොළඹ දිස්ත්‍රික්කයේ ඔසුසල් 49 කට අදාල ලිපිගොනු පරීක්ෂා කිරීමේදී 2017 වර්ෂයට අදාළව බලපත්‍ර අලුත් කර ගැනීමට කටයුතු කර නොතිබුණු ඔසුසල් 40 ක් පැවති බව නිරීක්ෂණය වූ අතර ඊට හේතු සොයා බලා බලපත්‍ර ලබා ගැනීමකින් තොරව ව්‍යාපාර කටයුතු කරගෙන යන්නේ නම් එය වැළැක්වීම සඳහා ක්‍රමවේදයක් අධිකාරිය විසින් ස්ථාපිත කර නොතිබුණි.

(iv) 2017 දෙසැම්බර් මාසයේ සිට විගණිත දිනය වූ 2018 අගෝස්තු 31 දින දක්වා වූ කාලපරිච්ඡේදයට අදාල බලපත්‍ර නිකුත් කිරීමේ ලේඛන පරීක්ෂාවේදී බලපත්‍ර අනුක්‍රමික අංක පිළිවෙලට නිකුත් නොකරන බව නිරීක්ෂණය වූ අතර බලපත්‍රය ඉල්ලුම් කළ අයදුම්කරු විසින් අදාළ මුදල් ගෙවූ රිසිට්පත අධිකාරිය වෙත භාරදීමේ සිට බලපත්‍රය නිකුත් කිරීම දක්වා ක්‍රියාත්මක වන ක්‍රියාවලියේ පවත්නා දුර්වලතා මීට හේතු වී තිබුණි.

**3.4 කාර්ය මණ්ඩල පරිපාලනය**

----------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට අධිකාරියේ අනුමත සේවක සංඛ්‍යාව 232 ක් වූ අතර තත්‍ය සේවක සංඛ්‍යාව 122 ක් ද පුරප්පාඩු සේවක සංඛ්‍යාව 111 ක් හා අතිරික්ත සේවක සංඛ්‍යාව 01 ක් ද විය. සෞඛ්‍ය පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ නිලධාරීන් 90 දෙනෙක් අධිකාරියේ සේවයේ යොදවා තිබුණු අතර මෙම නිලධාරීන් අතුරින් 34 දෙනෙක් සේවයේ යෙදවීම සඳහා 2015 අංක 05 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරි පනතේ 17 වන වගන්තිය ප්‍රකාරව, අදාල අනුමැතිය ලබාගෙන නොතිබුණි. තවද අනුමත කාර්ය මණ්ඩලය තුළ ඇතුලත් විධායක නොවන තනතුරක් සඳහා විශ්‍රාමික නිළධාරීන් තිදෙනෙකු හා අනුමත කාර්ය මණ්ඩලය තුළ ඇතුලත් නොවන යතුරු ලේඛක තනතුර සඳහා එක් නිලධාරියෙකු කොන්ත්‍රාත් පදනම මත බඳවා ගෙන තිබුණු අතර අධිකාරිය පිහිටුවා 2018 සැප්තැම්බර් 21 දින වන විට වර්ෂ 03 ඉක්මවා තිබුණද තනතුරු ස්ථිරව පිරවීමට අධිකාරිය අපොහොසත්වී තිබුණි.

(ආ) 2017 දෙසැම්බර් 31 දිනට අධිකාරියේ සේවයේ නියුක්තව සිටි සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයට අයත් සංවර්ධන නිලධාරීන් 06 දෙනෙකු හා රසායනාගාර සහකාර නිලධාරීන් දෙදෙනෙකු වශයෙන් මුළු නිලධාරීන් 8 දෙනෙකු අධිකාරියේ සේවා නියුක්ත කාලය අවසන් වීම මත සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය වෙත මුදා හැර තිබීම හේතුවෙන් විගණිත දිනය වූ 2018 අගෝස්තු 10 දින වන විට එම තනතුරු තවදුරටත් පුරප්පාඩුව පැවතුණි. තවද, සංවර්ධන නිලධාරී තනතුරට නිලධාරීන් 10 දෙනෙකු බඳවා ගැනීම සඳහා සහ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර තනතුරට එක් නිලධාරියෙකු බඳවා ගැනීම සඳහා 2017 අගෝස්තු 06 දින පුවත්පත් දැන්වීමක් පළ කර තිබුණද අදාළ බඳවා ගැනීම් පරිපාටියේ 5.4 ඡේදය ප්‍රකාරව ලිඛිත තරඟ විභාගයක් හා/හෝ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් අදාල නිලධාරීන් බඳවා ගැනීමට විගණිත දිනය වූ 2018 සැප්තැම්බර් 21 දින වන විටද අපොහොසත්වී තිබුණි.

(ඇ) 2016 ජුනි 12 දිනැති පුවත්පත් දැන්වීමක් මගින් අයදුම්පත් කැඳවා අධ්‍යක්ෂ (මානව සම්පත්) තනතුර සඳහා තෝරා ගෙන තිබුණු නිලධාරියා විසින් 2016 නොවැම්බර් 24 දින එම තනතුර භාර ගැනීම ප්‍රතික්ෂේප කර තිබුණු බැවින් නව නිලධාරියෙකු ස්ථිර වශයෙන් බඳවා ගැනීමට විගණිත දිනය වූ 2018 සැප්තැම්බර් 21 දින වන විටත් කටයුතු කර නොතිබුණු අතර වැඩ බැලීමේ පදනම මත නිලධාරියෙකු පත්කර තිබුණි.

(ඈ) පරිපාලන නිලධාරී තනතුරට එක් නිලධාරියෙකු සහ කළමනාකරණ සහකාර තනතුරට නිලධාරීන් 41 දෙනෙකු බඳවා ගැනීම සඳහා පිළිවෙළින් 2016 ජුනි 12 දින සහ 2016 නොවැම්බර් 22 දින පුවත්පත් දැන්වීම් පළ කර තිබුණි. එසේ වුවද 2018 සැප්තැම්බර් 21 දින වන විටද අදාල බඳවාගැනීම සිදුකර නොතිබුණු අතර කළමනාකරණ සහකාර තනතුර සඳහා කොන්ත්‍රාත් පදනම මත නිලධාරීන් 19 දෙනෙකු බඳවාගෙන තිබුණි.

(ඉ) අධිකාරියේ අනුමත කාර්ය මණ්ඩලයට ඇතුළත් වන සහකාර අධ්‍යක්ෂ/නියෝජ්‍ය අධ්‍යක්ෂ, අභ්‍යන්තර විගණක, ඖෂධ විශ්ලේෂක, පිරිවැය නිලධාරී, ඖෂධ පරීක්ෂක සහ ඖෂධවේදී යන තනතුරු 06 සඳහා බඳවා ගැනීමේ පරිපාටියක් පිළියෙල කිරීමට හෝ අනුමත කාර්ය මණ්ඩලය සංශෝධනය කිරීමට 2018 සැප්තැම්බර් 21 දින වන විටත් අපොහොසත්වී තිබුණි.

(ඊ) 2017 දෙසැම්බර් 31 දිනට අධිකාරියේ සේවයේ නියුක්ත නිලධාරීන් 97දෙනෙක් සඳහා විධිමත් පරිදි රාජකාරි ලැයිස්තු ලබාදී නොතිබුණි.

## 3.5 ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය

-------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.2 (ආ) මාර්ගෝපදේශය ප්‍රකාරව, සමාලෝචිත වර්ෂය වෙනුවෙන් පිළියෙල කර තිබුණු ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මට අදාළව ප්‍රසම්පාදන කාල සටහන පිළියෙල කර නොතිබුණි.

(ආ) අධිකාරිය විසින් මිල සැඳහුම් ක්‍රමය අනුගමනය කරමින් සමාලෝචිත වර්ෂයේදී එකතුව රු.1,351,167 ක් වූ අයිතම 6 ක් මිලදී ගෙන තිබුණු අතර ඒ සම්බන්ධයෙන් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.3.1 මාර්ගෝපදේශය ප්‍රකාරව, සම්මත ලංසු කැඳවීමේ ලේඛනවල යෝග්‍ය ආදර්ශකයක් භාවිතා කර නොතිබුණි.

(ඇ) ඉහත ප්‍රසම්පාදනයේදී පිරිවැය රු.182,850 ක් වූ වායු සමීකරණ යන්ත්‍රයක් සපයා ස්ථාපිත කර තිබුණද ඒ සඳහා ලංසු කැඳවීමේදී නඩත්තු හා සේවා කිරීම (Maintenance and Services) යන සේවාවන් ලංසු කැඳවීමේ ලේඛනවල ඇතුළත් නොකිරීම නිසා අදාළ සමාගම ඉදිරිපත් කරන ඕනෑම ගාස්තුවක් යටතේ නඩත්තු හා සේවා කිරීම ඉටුකර ගැනීමට අධිකාරියට සිදුවී තිබුණි. තවද මිලදී ගත් වායු සමීකරණ යන්ත්‍රය විගණිත දිනය වූ 2018 ජූලි 14 දින වන විටද ඉන්වෙන්ට්‍රි ලේඛනයට ඇතුළත් කර නොතිබුණි.

(ඈ) ඉහත ප්‍රසම්පාදනයේදී පිරිවැය රු.670,000 ක් වූ ලැප්ටොප් පරිගණක 05 මිලදී ගැනීම සම්බන්ධයෙන් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයෙහි 8.9.1(ආ) මාර්ගෝපදේශය ප්‍රකාරව, විධිමත් ගිවිසුමකට එළඹී නොතිබුණි.

(ඉ) ජාතික තරඟකාරී ලංසු කැඳවීම අනුගමනය කරමින් පිරිවැය රු.13,972,626 ක් වූ සංචල රාක්ක පද්ධතියක් සහිත ලිපිගොනු ගබඩාවක් සැලසුම් කොට, සපයා, ස්ථාපිත කිරීම සඳහා වූ ප්‍රසම්පාදනය සඳහා මුළු පිරිවැය ඇස්තමේන්තුවක් පිළියෙල කර නොතිබුණු අතර පිරිවිතර සැකසීමේ අඩුපාඩු පැවතීම හේතුවෙන් රු.325,000 ක් වැයකර ඉදිකරන ලද කවාකාර තරප්පු පෙල වෙනුවට රු.275,000ක තරප්පු පෙළක් නැවත ඉදිකිරීමට සිදුවී තිබීම හේතුවෙන් රු.325,000 ක අනාර්ථික වියදමක් සිදුවී තිබුණි.

## 4. තිරසාර සංවර්ධනය

-----------------------

## 4.1 තිරසාර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම

-------------------------------------------

තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 ''න්‍යාය පත්‍රය''ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින අතර සමාලෝචිත වර්ෂයට අදාළව අධිකාරිය විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳව දැනුවත් වී තිබුණු බව තහවුරු නොකෙරුණි.

## 5. පද්ධති හා පාලනයන්

----------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර අධිකාරියේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

| | **පද්ධති හා පාලන ක්ෂේත්‍ර** | **නිරීක්ෂණ** |
|---|---|---|
| (අ) | ආදායම් ගිණුම්ගත කිරීම | ආදායම් වර්ගීකරණය කර ගිණුම්ගත නොකිරීම. |
| (ආ) | ලියාපදිංචියෙන් නිදහස් කිරීම සඳහා ලිපි නිකුත් කිරීම | ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ ලිපි නිකුත් කිරීම අවම මට්ටමකින් පවත්වාගෙන යාමට කටයුතු කර නොතිබීම. |
| (ඇ) | කාර්ය මණ්ඩල බඳවාගැනීම | පනත ප්‍රකාරව කාර්ය මණ්ඩලය අනුයුක්ත කර නොතිබීම. |
| (ඈ) | ස්ථාවර වත්කම් පාලනය | අමාත්‍යාංශයෙන් ස්ථාවර වත්කම් පවරාගෙන නොතිබීම. |
| (ඉ) | ඔසුසල් බලපත්‍ර නිකුත්කිරීම | විධිමත් තොරතුරු පද්ධතියක් පවත්වාගෙන යාමට කටයුතු නොකිරීම. |
| (ඊ) | මූල්‍ය පාලනය | බැංකු සැසඳුම් නිසි පරිදි පිළියෙල නොකිරීම හා පිළියෙල කිරීමේ ප්‍රමාදයන් පැවතීම. |
| (උ) | ප්‍රසම්පාදනය | ලංසු විවෘත කිරීමේ කමිටු පත් නොකිරීම හා ලංසු විවෘත කිරීම නියමිත ආකෘති පත්‍රයක වාර්තා නොකිරීම. |